**දුරකථන**/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
Ministry of Education

**"ඉසුරුපාය"**
**බත්තරමුල්ල.**
'இசுருபாயா'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..................

මගේ අංකය / எமது இல. / My No. ඊඩී/08/01/01/24

දිනය / திகதி / Date 2017.02.27

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 2017 / 13

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

**<u>රාජ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමට එරෙහිව පාසල් සිසුන් පෙළඹවීම.</u>**

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව ඒ ඒ අමාත්‍යාංශ හා පළාත් අමාත්‍යාංශ විසින් දැනට මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින අතර නියමු මට්ටමේ ව්‍යාපෘතීන්ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. විශේෂයෙන් වසර 13ක අනිවාර්ය අධ්‍යාපන ලබාදීමේ ජාතික වැඩසටහනට අවශ්‍ය නිපුණතා සංවර්ධනයට හා පුහුණුවට පෞද්ගලික අංශයද දායක කර ගැනීම රජයේ අරමුණ වී ඇත.

දැනට ක්‍රියාත්මක කර ගෙනු යනු ලබන ඉහත සඳහන් වැඩසටහන් පිළිබඳව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වැරදි අවබෝධයක් ලබා දීම අරමුණු කරගත් විවිධ බාහිර ශිෂ්‍ය සංවිධානයන් විසින් පාසල් ශිෂ්‍ය ප්‍රජාව නොමග යැවීමට සංවිධානාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක බව දැන ගන්නට ලැබී ඇත. මෙය පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාවක් වනවා මෙන්ම පාසල් සිසුන්ගේ විනය පවත්වා ගැනීමට ද ගැටලුවක් වී ඇත.

එබැවින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරුන්ගේ/ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ විශේෂ අවසරයකින් තොරව කිසිම පාසලක සිසුන් පාසල් කාලය තුළදී පාසලෙන් පරිබාහිරව හෝ විවිධ උද්ඝෝෂණ වැඩසටහන්වලට සහභාගීවීමට අවස්ථාව ලබා නොදිය යුතු අතර පාසල් තුළට අවසරයකින් තොරව බාහිර පුද්ගලයින් හෝ කණ්ඩායම් ඇතුළුවීම හා පන්ති කාමරවලට ගොස් සිසුන් ආමන්ත්‍රණය කිරීමට හා ගුරුභවතුන් හමුවීමට අවස්ථාව ලබා නොදිය යුතුය. එසේම අනවසරයෙන් පාසල් භූමියට යම් කිසි පුද්ගලයකු හෝ පුද්ගලයින් කණ්ඩායමක් ඇතුළු වන්නේ නම් ඒ පිළිබඳව වහාම ළඟම ඇති පොලිස් ස්ථානයට දැනුම් දී පාසල් දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට සහ පාසලේ දෛනික කටයුතු පවත්වා ගැනීමට පියවර ගත යුතු වේ.